# ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පී. එල්. සී. හි සියලුම කොටස් හිමියන් වෙත කරනු ලබන දැනුම්දීමයි.

## 2023 ජුනි 30 වැනි දින ප.ව. 2.30 ට ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට නියමිත සමාගමේ 18 වැනි වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව කරනු ලබන දැනුම් දීමයි.

වර්තමානයේ රට තුළ උද්ගතව ඇති ආර්ථික අර්බුදය නිසා මුද්‍රණ කඩදාසි හිඟ වීම සහ මුද්‍රණ වියදම් අධික වීම හේතුවෙන් මෙම වසරේ මුද්‍රිත වාර්ෂික වාර්තාව නිකුත් කරනු ලබන්නේ මෙම දැන්වීමේ සිට වැඩ කරන දින අටක් ඇතුළත අප විසින් හඳුන්වා දී ඇති පෝරමයට අනුව ලිඛිතව එය ඉල්ලා සිටින කොටස් කරුවන් වෙත පමණක් බව කරුණාවෙන් සලකන්න.
කෙසේ වෙතත්, සියලුම කොටස් හිමියන් හට එක හා සමානව මෙන්ම කිසිදු අගතියකින් තොරව සමාගමේ වාර්ෂික වාර්තාවට ප්‍රවේශ වීමට සහ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම සහ තහවුරු කිරීම සඳහා අපි රැස්වීම පිළිබඳ දැන්වීම (පහත දක්වා ඇත) සහ අදාළ ලියකියවිලි, ඇතුළුව 'ඔන්ලයින්' තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන වාර්ෂික මහා සභා රැස්වීම සඳහා මාර්ගෝපදේශ හා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ රැස්වීමට සහභාගි වන කොටස් හිමියන්ගේ විස්තර ලියාපදිංචි කිරීම - 2023, (ලියාපදිංචි කිරීමේ පෝරමය) CSE වෙබ් අඩවියට (http://www.cse.lk/home/company-infor/PLRN0000/financial) සහ අපගේ ආයතනික වෙබ් අඩවියට (http://www.primeresidencies.lk/investor-relations) ඇතුළත් කර ඇති බව දන්වා සිටිමු.

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව දැනුම්දීම

පහත සඳහන් කරුණු වෙනුවෙන් ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී හි කොටස් හිමියන්ගේ 18 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2023 ජුනි මස 30 වැනි දින ප.ව. 2.30 ට ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. රැස්වීම පිළිබඳ දැනුම්දීම

2. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ගිණුම් ප්‍රකාශයන් විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම සහ සලකා බැලීම

3. 2022/23 මූල්‍ය වර්ෂයේ ලාභයෙන් ප්‍රකාශයට පත් කර කොටස් හිමියන් වෙත ගෙවන ලද කොටසකට රු. 1/- ක අතුරු ලාභාංශය එකී වර්ෂය සඳහා වන අවසන් ලාභාංශය ලෙස සලකනු ලැබීමට යෝජනා සම්මත කිරීම

4. ආයතන රීති සංග්‍රහයේ ඇතුලත් යහපත් පරිචයන්ට අනුව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් විශ්‍රාම යන ධම්මික කලපුගේ මහතා නැවත තෝරා පත් කර ගැනීම

5. ආයතන රීති සංග්‍රහයේ ඇතුලත් යහපත් පරිචයන්ට අනුව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් විශ්‍රාම යන මහින්ද පෙරේරා මහතා නැවත තෝරා පත් කර ගැනීම

6. BDO Partners හවුල්කරුවන්, වරලත් ගණකාධිකාරීවරුන් ඊළඟ වසර සඳහා සමාගමේ විගණකවරුන් ලෙස නැවත පත් කිරීම සහ ඔවුන්ගේ වේතනය තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම

7. 2023/24 වසර සඳහා පුණ්‍ය කටයුතු සහ අනෙකුත් පරිත්‍යාග සඳහා දායක මුදල් තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරීම

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී
අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව

Pele Consulting (Private) Limited
(අත්සන් කරන ලදී)
සමාගම් ලේකම්වරු
දිනය : 2023 ජුනි 7

PRIME RESIDENCIES